**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - 2020**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පිරිවැය රු.182,594,766 ක් වූ තොගය තුළ ඇතුළත් හානි වූ හා භාවිතයෙන් ඉවත්කළ පිරිවැය රු.25,072,505 ක් වූ තොගය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්ෂ අවසාන තොග ගණනය කිරීමට විශ්වවිද්‍යාල සමීක්ෂණ මණ්ඩල පත්කරනු ලබන අතර, එම සමීක්ෂණ මණ්ඩල එක් එක් ඒකකයන්හි තොගය භෞතිකව සමීක්ෂණය කරයි. එම භෞතික තොග සමීක්ෂණ වාර්තා පදනම්ව වර්ෂ අවසාන තොග ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. | විශ්වවිද්‍යාලයේ එක් එක් ඒකකයන්හි පවතින තොග සම්පූර්ණයෙන් භෞතික සමීක්ෂණයට ලක්කර වර්ෂය අවසානයට පවතින නිම් හා නොනිම් තොගයත් භාවිතයට ගත නොහැකි තොගයක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ශිෂ්‍ය ආදායම නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව ශිෂ්‍ය පාලන ගිණුමේ ශේෂය හා හඳුනානොගත් ශිෂ්‍ය ආදායම් ගිණුමේ ශේෂය අතර රු. 302,544,894 ක වෙනස ලැබිය යුතු ශිෂ්‍ය ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ලෙජර් ගිණුම් දෙකක් වන ශිෂ්‍ය පාලන ගිණුම හා හඳුනානොගත් ශිෂ්‍ය ආදායම් ගිණුමෙහි සඳහන් තොරතුරු පදනම්ව ලැබිය යුතු ශිෂ්‍ය ආදායම ගණනය කර ඇති බැවින් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශිෂ්‍ය ආදායම ලෙස සඳහන් කර ඇති අගය නිවැරදි බව සඳහන් කරනු කැමැත්තෙමි. | ලැබිය යුතු ශිෂ්‍ය ආදායම හඳුනාගැනීමට හා ගිණුම්ගත කිරීමට නිවැරදි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය අනුව ලියාපදිංචිය අලුත් නොකර වර්ෂ 05 ඉක්මවූ ශිෂ්‍යයින්ගෙන් ලැබිය යුතු ශිෂ්‍ය ආදායම් සෑම වසරකදීම ආදායමට එරෙහිව කපාහරින බව සඳහන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී වර්ෂ 5 ඉක්ම වූ ශිෂ්‍යයින්ගෙන් ලැබිය යුතු රු.40,655,161 ක ශිෂ්‍ය ආදායම කපා හැරීම සිදුකර තිබුණද ඒ සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සෑම වසරකම වර්ෂ 5ක් ඉක්මවා ලියාපදිංචිය අලුත් නොකල ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු යම් මුදලක් වේ නම් එම මුදල වියදමක් ලෙස කපා හැරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරයි. එබැවින් විශ්වවිද්‍යාලය හැරගිය සිසුන්ගෙන් ලැබිය යුතු මුදල් කාලීන අයකර ගැනීමක් ප්‍රායෝගිකව සිදුකල නොහැකි වේ. | රජයට ලැබිය යුතු වන වෙනත් ගාස්තු හෝ අත්හැර දැමීමට අවසර දීමටද, නොසැලකිල්ලක් හෝ වරදක් හෝ වංචාවක් හෝ සිදුවී නැති බව ඒත්තු ගොස් තිබෙන කවර අවස්ථාවක වුවද ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් අවසර ලබාගත යුතු බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගෙවීම් වවුචරයක්, ලදුපතක් හෝ ජර්නල් වවුචරයක් මඟින් ලෙජර ගිණුමකට හර හෝ බැර සටහන් යෙදිය යුතු වුවත්, විශ්වවිද්‍යාලයේ OMIS පරිගණක පද්ධතියේ පැවති අඩුපාඩු හේතුවෙන් ක්ෂය ගිණුම් හා ක්ෂය වෙන්කිරීමේ ගිණුම් වලට Day end process transaction ලෙස පරිගණක ගිණුම් පද්ධතිය තුළින් සටහන් යෙදීම සිදුවී තිබුණි. එලෙස ලෙජර ගිණුම්වලට සටහන් වී තිබුණු නමුත් නිවැරදි නොවුණු රු.25,692,337ක් වර්ෂය අවසානයේදී ජර්නල් සටහන් යොදා ක්ෂය ගිණුම් හා ක්ෂය වෙන් කිරීමේ ගිණුම් වලින් ඉවත් කර තිබුණි. තවද වැටුප්, | OMIS පද්ධතියේ වත්කම් ලේඛනය වර්ෂ කිහිපයක් නිවැරදිව යාවත්කාලීන නොවූ බව නිරීක්ෂණය වූ අතර ,එම පද්ධතිය තුල පවතින සීමාවන් හේතුවෙන් එය පසුව නිවැරදි කිරීමට ද නොහැකි විය .එම නිසා පරිගණක පද්ධතිය මඟින් ක්ෂය ගණනය කිරීම් නිවැරදිව සිදු නොවේ. ඒ අනුව පරිගණක පද්ධතිය මඟින් ලබා දෙන ක්ෂය ගණනය කිරීම් ජනල් සටහන් මඟින් ඉවත්කර ,නිවැරදිව | නිවරදි පර්ගණක මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| තොග, වත්කම් යනාදී ලෙජර ගිණුම්වලටද මූලාශ්‍ර ලේඛන නොමැතිව, Day end process transaction ලෙස අගයන් සටහන් වී තිබුණු බවද නිරීක්ෂණය විය. | ගණනය කරන ලද වාර්ෂික ක්ෂය අගය ජ'නල් සටහන් මඟින් පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම සිදුකරයි. වැටුප් සඳහා වන පරිගණක පද්ධතිය (Payroll System) හා ඉන්වෙන්ට්‍රි මොඩියුලය මඟින් සෘජුව සිදුකරනු ලබන මාරුකිරීම් (Day end Process Transaction) ලෙස සටහන් වී ඇත. නමුත් වැටුප්, තොග හා වත්කම්වලට අදාල මූලාශ්‍ර ලියවිලි ගිණුම් අංශය සතුව ඇත. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 102, 103, 104, හා 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) 2018, 2019 හා 2020 වර්ෂවලදී පිළිවෙලින් රු.19,517,405 ක්, රු.2,637,980 ක් හා රු.2,891,380 ක් වූ හානි වූ පොත් තොග කපාහැරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් කපාහැරීම සිදුකර තිබුණි. තවද, තොග ඌනතා, අතිරික්තා සම්බන්ධයෙන්ද ආරම්භයේ සිටම | තොග සමීක්ෂණ වලින් හඳුනාගත් තොග ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා චක්‍රලේඛන විධිවිධාන අනුව අදාල කටයුතු විධිමත්ව සිදුකිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | |
| | | (ii) 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව පැවති වෙනස්කම් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් කිරීම සඳහා උපකුලපතිතුමා විසින් මූලික විමර්ශණ මණ්ඩල දෙකක් පත්කර තිබුණද, 2021 අගෝස්තු මාසය වන විටත් ඒ සම්බන්ධයෙන් කටයුතු නිමකර නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සිදුකල භාණ්ඩ තොග සමීක්ෂයේදී ඌණ භාණ්ඩ සඳහා පත්කල විමර්ශන මණ්ඩල වාර්තා පදනම් කරගෙන පාලක සභා අනුමැතිය සහිතව අදාල කටයුතු සිදුකර ඇත. එහෙත් ඇතැම් මණ්ඩල වාර්තා මේ දක්වා ලබා දී නොමැත. මේ සම්බන්ධයෙන් අදාල විමර්ශන මණ්ඩල වෙත කිහිපවරක් සිහි කැඳවීම් යවා ඇත. අදාල වාර්තා ලද විගස පාලක සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 394 (ඇ) | වර්ෂ 08 ක සිට පැවතෙන අවලංගු චෙක්පත් තැන්පතු ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට රු. 1,232,629ක් වූ ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අවලංගු චෙක්පත් තැන්පතු ශේෂය විශ්වවිද්‍යාල ආදායමට ගැනීමට මෙම වසරේදී කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛනගත කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 756 | 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත්, තවදුරටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.181,639,603ක් වූ පුස්තකාල පොත්පත් සමීක්ෂණයට ලක්කර නොතිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා ඇති රු.182,594,766 ක් වූ තොග ගණනය කිරිමේදී මුද්‍රණාලයේ පැවති | වර්ෂ අවසාන තොග ගණනය කිරීමට විශ්වවිද්‍යාල සමීක්ෂණ මණ්ඩල පත්කරනු ලබන අතර, එම සමීක්ෂණ මණ්ඩල එක් එක් ඒකකයන්හි තොගය භෞතිකව සමීක්ෂණය කරයි. එම භෞතික තොග සමීක්ෂණ වාර්තා පදනම්ව වර්ෂ අවසාන තොග ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සියළුම ඒකකයන්ට තොග භෞතික සමීක්ෂණයට ලක් කර විගණකාධිපති වෙත සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නොනිමි තොගය හා සියලුම ඒකකයන්හි සියලුම තොග භෞතික සමීක්ෂණයට ලක් කිරීම සිදුකර නොතිබුණි. | | |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් රු.14,424,847,934 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සහ රු.18,968,248ක් වූ අස්පෘශ්‍ය වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ස්ථාවර වත්කම් සඳහා වූ පරිගණක ගත පද්ධතියේ පවතින අඩුපාඩු හේතුවෙන් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමේ ගැටළු මතුවී ඇත. විශ්වවිද්‍යාලය විසින් ස්ථාපනය කරනු ලබන නව පරිගණක පද්ධතිය මඟින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට අදහස් කර ඇති අතර ,එම පද්ධතිය මඟින් ස්ථාවර වත්කම් ලේඛනයේ දුර්වලතා මඟහරවා ගැනීමට හැකිවේ යන්න අපගේ බලාපොරොත්තුව වේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අනාවරණය කරනු ලබන ස්ථාවර වත්කම් තහවුරු කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 354 දෙනෙකුගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.1,601,385,340 ක් ගෙවා තිබුණි. | අධ්‍යයන කාර්ය මණ්ඩලය වැඩ නියමාවලියට (Work norm) අනුකූලව අධ්‍යයන අංශ ප්‍රධාන සහ පීඨාධිපතිගේ අධීක්ෂණය යටතේ තම කාලසටහනට අනුව අධ්‍යයන කාර්යයන් කිරීම සිදු කරයි. ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන සලසා තිබුණද, අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සටහන් කරනු නොලැබේ. | 2014 වසරේ පැවති රාජ්‍ය ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ඒ සම්බන්ධයෙන් ක්‍රමවේදයක් ඇති කිරීමට උසස් අධ්‍යාපන ලේකම්තුමා හා විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ සභාපතිද එකඟ වූ බව මීට පෙර පිළිතුරුවල දක්වා ඇත. ඒ අනුව නිලධාරීන්ට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි කළමණාකරණයේ අවධානය යොමු කළ යුතුය. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ | මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව | 2020 වර්ෂයේදී කිසිදු කෙටිකාලීන ආයෝජනයක් | චක්‍රලේඛය ප්‍රකාරව පූර්ව අනුමැතිය |

| | | | |
|---|---|---|---|
| 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනය විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.94,679,223 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | සිදු කර නොමැත.<br>රු. 670,222,783 ක මුදල එක් වර්ෂයක ආයෝජනයක් නොවන අතර වර්ෂ ගණනාවක ආයෝජනයන්හි එකතුවකි. මෙහිදී Generated Fund වල ආයෝජනය වන රු. 251,886,511 සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමේ ලිපි භාණ්ඩාගාරයට යොමුකර ඇත.<br>භාණ්ඩාගාර අනුමැතිය ලැබෙන තුරු කෙටිකාලීනව ආයෝජනය කිරීම් ප්‍රමාද කල නොහැකි බැවින් භාණ්ඩාගාර නිළධාරීන්ගේ උපදෙස් මත ස්ථාවර තැන්පත්වල ආයෝජනය කරන අවස්ථාවේදීම භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලීමේ ලිපි භාණ්ඩාගාරයට යොමුකර ඇත. | ලබාගෙන ආයෝජනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 531,516,776 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 587,333,873 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 57,817,097 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන හා කෙටිකාලීන පාඨමාලා ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරනු ලබන ප්‍රාදේශීය මධ්‍යස්ථාන හා අධ්‍යයන මධ්‍යස්ථාන 19 ක සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 584,909,510 ක් වැයකර | විශ්වවිද්‍යාලය විසින් නීත්‍යානුකූල හිමිකම් ලබා නොමැති ඉඩම් කැබලි විශ්වවිද්‍යාලය විසින් භුක්තිවිදිනු ලබන ඉඩම් කැබලි විසිපහෙන් (25) දාහතක (17) අයිතිය 2021/07/19 දින පැවති අමාත්‍ය | අදාළ ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි ඉදිකර තිබුණද, එම ඉඩම්හි නීත්‍යානුකූල අයිතිය විශ්වවිද්‍යාලයට ලබා ගැනීම සඳහා 2021 ජූලි 10 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මණ්ඩල රැස්වීමේදී විශ්වවිද්‍යාලය වෙත පවරා දීමට අවශ්‍ය වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවූ අතර ඉඩම් කොමසාරිස් ජනරාල් මඟින් අදාළ ඉඩම් වල අයිතිය විශ්වවිද්‍යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට අවශ්‍ය වන කටයුතු සිදුවීමට නියමිත අතර ඊට අදාළ පසුවිපරම් සිදුකරනු ලැබේ.<br>එසේම විශ්වවිද්‍යාලය විසින් භුක්ති විඳිනු ලබන අනෙකුත් ඉඩම් ද විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් සිදු කෙරෙමින් ඇත. | |
| (ආ) | 1992 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සේවය අත්හිටුවීම, සේවය අවසන් කිරීම, සේවයෙන් ඉවත් කිරීම, සේවය අතහැරයාම, වැඩ තහනම් කිරීම් හා විශ්‍රාම යාම වැනි කරුණු හේතුවෙන් නිළධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 850,958 ක් අයකර ගැනීම සඳහා 2021 අගෝස්තු මාසය වන විටත් කටයුතු කර නොතිබුණි. | අය නොවූ ණය ශේෂයන්ගෙන්<br>රු. 174,406 ක මුදලක් අදාල පුද්ගලයාගේ අර්ථසාධක අරමුදලින් අඩුකර විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇති අතර රු. 147,790 ණය ශේෂයන් අයකර ගැනීමට අදාල පුද්ගලයින්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇත.<br>රු. 380,972 ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අදාල පුද්ගලයන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා අප වෙත ලැබී නොමැති අතර, එම පත්‍රිකා ලැබුණු පසු ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී එම ණය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ ණය මුදල් අයකර ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| (ඇ) | 1989 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලසීමාව තුළ බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු. 19,884,652 ක මුදලින් කිසිදු මුදලක් ගිවිසුම් කඩකළ දින සිට විගණිත දිනය වූ 2020 දෙසැම්බර් 31 දින දක්වාම අයකරගෙන නොතිබුණි. නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 4,942,969 ක බැඳුම්කර වටිනාකම් අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කරන බව 2016 වර්ෂයේ සිට දිගින් දිගටම විගණනය වෙත දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර ද නොතිබුණි. | එක් ණයකරුවෙකුගේ ලිපිනය සොයාගත්තද එය කාලවිරෝධයට ලක් වී ඇති බැවින් අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනිමේ හැකියාව සොයා බලමින් පවති. එසේම නිලධාරීන් 6 දෙනෙකු සම්බන්ධව මුල් ණය කරුවන්ගේ හා ඇපකරුවන්ගේ ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වීම නිසා නඩු පැවරීමට හා ගිවිසුම් වටිනාකම අයකර ගැනීමට නොහැකි වී ඇත.<br>ණයකරුවන් 05 දෙනෙකුගේ ණය ශේෂ අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීමට කටයුතු කරන බවද තවත් එක් ණයකරුවෙකුට නඩු පැවරීමටද කටයුතු කර ඇත. | අයවිය යුතු මුදල් කාලවරෝධයට ලක්වීමට පෙර අයකර ගැනීමට හැකි පරිදි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විශ්වවිද්‍යාලයේ අංශ 05 ක කටයුතු සම්බන්ධයෙන් මොඩියුල 05 ක් ලෙස ස්ථාපනය කර තිබුණු කළමනාකරණ තොරතුරු පද්ධතියේ (OMIS) පවතින අඩුපාඩු නිරාකරණය කිරීමට අදාළ නඩත්තු සමාගම්වලට නොහැකි වී තිබුණි. එම නිසා පවතින තොරතුරු පද්ධතියට වඩා කාර්යක්ෂම සහ විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස තොරතුරු තාක්ෂණ අංශය මඟින් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරවා ගැනීමට විශ්වවිද්‍යාලය අවධානය යොමු කර ඇති බව උපකුලපතිවරයා විසින් දන්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට හෝ නව තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරවා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | නව තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු මේ වන විටත් ක්‍රියාත්මක වේ. එම පද්ධතියේ ආරම්භය ලෙස ශිෂ්‍ය ලියාපදිංචි කටයුතු 2020 දෙසැම්බර් මාසයේ සිට නව පද්ධතිය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. අනෙකුත් කටයුතුද අදියර වශයෙන් නව පද්ධතිය මඟින් ඉදිරියේදී ක්‍රියාත්මකවනු ඇත. | නිවැරදි කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |